*Vidyodaya J., Arts, Sci., & Lett., Vol. 1 No. 2 — January 1987 — pp. 73-92*

# මහාපරාක්‍රමබාහු රජතුමාගේ තුන් නිකා සමගිය

**පූජ්‍ය යටදෙළවත්තේ ධම්මවිසුද්ධි හිමි**

ඉතිහාස අධ්‍යානාංශය කැලණිය විශ්ව විද්‍යාලය

මහාපරාක්‍රමබාහු රජතුමා විසින් සිදු කරන ලද තුන් නිකා සමගිය ශ්‍රී ලංකා ශාසන ඉතිහාසයේ අතිශයින් වැදගත් සිද්ධියකි. වළගම්බා රාජ්‍ය කාලයේ සිට පැවත ආ නිකාය භේදය සමථයකට පත් කිරීමට සෙසු නරපතියන් ගත් සියලු වැයම් නිෂ්ඵල විය. එතෙක් වෙන කිසි නරවරයෙකුට කළ නොහැකිව තිබූ මෙම භාර දූර කාර්‍ය්‍යය සිදු කිරීමෙහිලා මහාපරක්‍රමබාහු රජතුමා උපයෝගී කරගත් ක්‍රියා මාර්ග සහ එහිලා ක්‍රියාකාරි වූ බලවේග මොනවාදැයි සොයා බැලීම මෙම ලිපියෙහි ප්‍රධාන පරමාර්ථයයි.

තුන් නිකා සමගිය[1] පිළිබඳ වැදගත්ම මූලාශ්‍රය වශයෙන් සැලකෙන මහාවංසයේ ඒ හා සම්බන්ධ විස්තර වාර්තා දෙකක් තිබේ.[2] ඉන් පළමු වැන්න 71 වෙනි පරිච්ඡේදයෙහි ද දෙවැන්න 76 වෙනි පරිච්ඡේදයෙහි ද දැකිය හැකිය. මහාවංසයේ අදළ කොටස ලියූ කතුවරයා විසින් පරිශීලනය කරන ලද මූලාශ්‍ර දෙකක තිබුණු වාර්තා දෙකක් එලෙසින්ම වාර්තා කිරීම හේතුකොට ගෙන තුන් නිකා සමගිය ගැන විස්තර වාර්තා දෙකක් මහාවංසයට ඇතුළත් වන්ට ඇති බව ගයිගර් පඩිතුමා පෙන්වා දෙයි[3] ඇතැම් විට වාර්තා දෙකක් එකම සිද්ධිය ගැන සඳහන් වන්නේ නිකායන් සමගි කිරීමට ගත් උත්සාහයන් දෙකක් වූ නිසා ද වන්ට ඇත. නිකාය සමගියට ඇතැම් සංඝ සංවිධානවලින් එල්ල වූ දැඩි විරෝධතා හේතුකොට ගෙන හෝ වෙන යම්කිසි බාධකයක් ඉදිරිපත්වීම නිසා මුල් වැයම අත හැර දැමුවාද විය හැකිය. එසේ නම් 76 වෙනි පරිච්ඡේදයෙන් හෙළි වන්නේ ඒ සියලු බාධක මැඩගෙන වඩා සංවිධිත ක්‍රියා පිළිවෙළක් අනුගමනය කොට නිකායන් සමගි කිරීමට ගත් දෙවෙනි වැයම විය යුතුයි. කෙසේ හෝ මෙම කාර්‍ය්‍යය මහාපරාක්‍රමබාහු රජතුමාගේ දෙළොස්වෙනි රාජ්‍ය වර්ෂයේ දී එනම් ක්‍රි.ව. 1164–65 වර්ෂයේ දී සිදු කරන ලද බව මූලාශ්‍රයන්ගෙන් හෙළි වේ.[4]

නිකාය සමඟි කිරීමට තුඩු දුන් ප්‍රධාන හේතු දෙකක් වූ බව පෙනේ. ඉන් පළමු වැන්න නම් දුෂ්ප්‍රතිපත්තිවල නියැලුණු ශ්‍රමණ ප්‍රතිරූපකයන් නිසා සසුන කෙළෙසෙමින් පැවතීමයි. දෙවැන්න දුර්ලබ්ධි පැතිර යෑම නිසා බුදු දහම කෙළෙසීමයි.

තුන් නිකා සමගිය සම්බන්ධයෙන් මතුවන වැදගත් කරුණු සාකච්ඡා කිරීමට පළමු එම සමගිය සිදු කළ ආකාරය පිළිබඳව හැඟීමක් ඇති කර ගැනීම අවශ්‍ය වෙයි. මහාවංසය අනුව මහා පරාක්‍රමබාහු රජතුමා මහාකාශ්‍යප මහාස්ථවිරයන් ප්‍රමුඛ සංඝයා ගෙන් සැදුණු විනිශ්චය මණ්ඩලයක සහාය ඇතිව සසුන කෙළෙසීමට හේතු වූ නිකාය භේදය නැති කොට මහා විහාර, අභයගිරි, ජේතවන යන නිකායත්‍රය සමගි කිරීමට ඉදිරිපත් විය. එම කාර්‍ය්‍යය ආරම්භ කළේ මහාවිහාර, අභයගිරි සහ ජේතවන යන නිකායත්‍රයට අයත් භික්ෂු ප්‍රතිරූපකයන් ශොධනයට භාජන කිරීමෙනි; නැතහොත් සංශොධනයක් කිරීමෙනි. එවිට එය මහත් බැරෑරුම් කටයුත්තක් බව රජුට පෙනී ගියේය. මේ අවස්ථාවේදී භික්ෂූහු නොයෙක් අන්දමින් විරෝධය පළ කළහ. ඇතැමුන් විදේශ බලා ගිය අතර තවත් කෙනෙක් උපැවිදි වූහ. විනිශ්චය මණ්ඩලයෙහි අසුන් ගැනීමට පවා අකැමැති වූ තවත් භික්ෂූහු වූහ. සංශෝධනය සිදු කළේ විරෝධය දැක්වූ භික්ෂූන් යම්තම් සනසා ගැනීමෙනි.[6] පළමුවෙන්ම ම කරන ලද්දේ මහාවිහාර

නිකාය ශෝධනය කිරීමයි. උන්වහන්සේලා අතර වූ වුදිතයන් පළමුවෙන් තෝරා ගෙන ප්‍රකෘතිමත් කළ හැකි වූවෝ ප්‍රකෘතිමත් කරනු ලැබූහ. ලාභාපේක්ෂාවෙන් සසුන් ගත වී සසුන කිළිටි කරමින් සිටි ප්‍රකෘතිමත් කළ නොහැකි දුශ්ශීලයන්ට උසස් ධානාන්තර (මහාධානාන්තර) දී ඔවුහු උපැවිදි කරනු ලැබූහ.[6] මේ අන්දමට මහා විහාරිකයන් අතර වූ අයෝග්‍ය පුද්ගලයන් ශෝධනයට භාජනය කොට පළමු කොට සිදු කළේ මහා විහාරිකයන් ඔවුනොවුන් හා සමගි කිරීමයි. ඊළඟට අභයගිරි සහ ජේතවන දෙනිකාය මහාවිහාරිකයන් හා සමගි කිරීමට උත්සාහ කරන ලදී. එහෙත් එය "කඳ සමඟ රුවන් ගළපන්ට" යැමක් මෙන් වූ බව මහාවංසය කියයි.[7] විනිශ්චය මණ්ඩලයේ තීරණය අනුව එම දෙනිකායෙහි උපසම්පද සීලය ආරක්ෂා කරගෙන සිටි එකද භික්ෂුවක් නොවීය. එහෙයින් ඉන් බොහෝ දෙනෙකු සාමණේර තත්ත්වයට පහත හෙළා සෙස්සන්ට මහ තනතුරු දී ඔවුහු උපැවිදි කරනු ලැබූහ.[8]

මහා පරාක්‍රමබාහු ගේ නිකාය සමගිය පිළිබඳව නිකාය සංග්‍රහය, සද්ධර්මරත්නාකරය, දළදා පූජාවලිය යන මූලාශ්‍රවල සඳහන් තොරතුරු මහාවංසයෙන් වෙනස් වේ. එම මූලාශ්‍රවල සමගි කරනු ලැබූ නිකාය තුනට අයත් වන්නේ ධර්මරුචි, සාගලිය සහ වෛතුල්‍ය යන නිකාය තුනයි. මහා විහාර නිකාය ඊට අයත් නොවේ.[9] අනික් නිකාය තුනට අයත් "නොයෙක් සියගණන් දුශ්ශීල පාප භික්ෂූන්" පොළොන්නරුවෙහි ලතා මණ්ඩපයට රැස්කරවා ඔවුන් සසුනෙන් නෙරපා හරින ලද බව නිකාය සංග්‍රහය කියයි.[10] පොළොන්නරු කතිකාවත අනුව සමගි කරන ලද තුන් නිකායට මහාවිහාරය අයත් වේ. එහෙත් මහාවිහාරිකයන් අතර දුශ්ශීලයන් සිටි බවක් එහි නො කියැවෙයි. සංඝ සාමග්‍රිය කිරීමේ දී මහාපරාක්‍රමබාහු රජතුමා සහාය පැතුවේ "ශීලස්කන්ධාදී ලෞකික ගුණරත්නාලංකාරයෙන් සමලංකෘතවූ උදුම්බරගිරි නිවාසි මහාකාශ්‍යප මහාස්ථවිර ප්‍රමුඛ මහාවිහාරධිවාසී භික්ෂු සංඝයා" ගෙනි.[11] මෙයින් මහාවිහාරවාසීන් සිල්වතුන් හැටියට හඳුන්වන නමුත් උන්වහන්සේලා සියල්ලම එක සේ සිල්වතුන් වූ බවක් එයින් පැහැදිලිව නොකියැවෙයි. මහාවිහාරිකයන් අතර දුශ්ශීලයන් සිටි බව සහ ඔවුන් ශෝධනයට භාජන කරන ලද බව පැහැදිලිව සඳහන් වන්නේ මහාවංසයෙහි පමණි. එතෙකුදු වුවත් මහාවංසයෙහි මහාවිහාර නිකායට අයත් නොවූ සියලුම භික්ෂූන් දුශ්ශීලයන් හෝ මහලු පැවිද්දට හානි පමුණුවා ගත්තවුන් හැටියට පෙන්වා තිබීම විමසා බැලිය යුතු කරුණකි.

මේ සම්බන්ධයෙන් පළමුව විමර්ශනයට භාජන කෙරෙන්නේ මහාවිහාර, අභයගිරි, ජේතවන යන නිකාය තුනයි. මෙම නිකායත්‍රයෙන් අභයගිරි, ජේතවන දෙනිකායට අයත් සියලුම භික්ෂූන් දුශ්ශීලයන් බව කීමට හේතු කිසිම මූලාශ්‍රයක පැහැදිලිව පෙන්වා නැත. ඊට හේතු යම්තම් හෝ දක්වන මහාවංසය ඔවුන් වෛතුල්‍ය ආදී දුර්මත බුද්ධභාෂිත හැටියට පැතිර වූ බව, ප්‍රතිපත්ති පරාඞ්මුඛ වූ බව සහ මහලු පැවිද්දට හානි පමුණුවා ගත් දුශ්ශීලයන් බව කියයි.[12] එහෙත් ඔවුන් ප්‍රතිපත්ති පරාඞ්මුඛ වූ සැටි සහ මහලු පැවිද්දට හානිකරගත් සැටි එයින් පැහැදිලි නො වෙයි. විශේෂයෙන්, නිකායකට එල්ල නොකොට භික්ෂූන් අතර තිබූ දුශ්චරිත ගැන සඳහන් කරන විට අඹුදරුවන් පෝෂණය කළ ශ්‍රමණ ප්‍රතිරූපකයන් සංඝ ග්‍රාමවල සිටි බව මහාවංසයෙහි සඳහන් වෙයි.[13] එයින් අනුමාන කළ හැක්කේ එම දුර්වලකම් පොදු වේ සෑම නිකායක ම භික්ෂූන් අතර තිබෙන්ට ඇති බව මිස එක් නිකායකට පමණක් සීමා නොවූ බවයි. අභයගිරි, ජේතවන දෙනිකායේ සියලු භික්ෂූන් දුශ්ශීලයන් හැටියට පෙන්වීමට හේතුව එයින් පැහැදිලි නො වෙයි. එම නිකායිකයින් අනුගමනය කළ විනය ප්‍රතිපත්ති මහාවිහාර සම්ප්‍රදායෙහි පිළිගත් විනය ප්‍රත්තිපත්ති අනුව මහලු පැවිද්දට හානි සිදු වන තරමේ ඒවා නම් ඒ පමණක් වුවද එම භික්ෂූන් දුශ්ශීලයන් හැටියට සැලකීමට ප්‍රමාණවත් හේතුවක් වෙයි.

මේ සඳහා අභයගිරි, ජේතවන දෙනිකාය විනය සම්බන්ධයෙන් පිළිගත් මත මොනවා දැයි විමසා බැලිය යුතුයි. මෙම නිකාය දෙක මහා විහාරය පිළිගත් විනය පිටකය සම්බන්ධයෙන් විරුද්ධ මත දරූ බව වංසත්ථප්පකාසිනිය කියයි. ඒ අනුව අභයගිරිකයන් බුදුන් වදළ ඛන්ධක, පරිවාර දෙක අර්ථ විවරණය කිරීම් වශයෙන් සහ පාඨාන්තර ගෙනහැර දැක්වීම් වශයෙන් වෙනස් කළ අතර ජේතවනිකයෝ විභංග දෙකෙහි එකී වෙනස්කම් කළහ.[14] එසේ ඇති කළ වෙනස්කම් ගැන අවබෝධයක් ඇති කර ගැනීම පහසු නොවේ. එහෙත් අතරින් පතර දක්නට ලැබෙන නිදසුන් කීපයක් ගෙන බැලීමෙන් අභයගිරිකයන් දරූ ප්‍රතිවිරුද්ධ මත ගැන අල්පමාත්‍ර අවබෝධයක් ලබා ගත හැකි වනු ඇත. ඇන්දත් මුවා මීටි සහිත විජිනිපත් පාවිච්චි කිරීම, දූතයකු මාර්ගයෙන් උපසම්පදාව දීම, කුස පිළිසිඳගත් තැන් සිට වයස ගැණ උපසම්පදාව දීම, සීමාන්තරිකය නිමිති කර ගැනීම් පමණකින් ඛණ්ඩ සීමාවෙහි මැඩීමක් නොවන බව සහ දැහැටි වැළඳීමෙන් පසුව බිමට කෙළ ගැසීම යන මේවා මහා විහාරිකයන් විනයානුකූල හැටියටත් අභයගිරිකයන් විනය විරෝධි හැටියටත් සැලකූ බව වංසත්ථප්පකාසිනියෙහි සඳහන් වේ.[15]

අභයගිරිකයන් සහ මහාවිහාරිකයන් අතර විනය පිළිබඳව පැවති ප්‍රතිවිරුද්ධ මතයක් විමති විනොදනයෙහි ද සඳහන් වේ. මෙය සුරාපානය සම්බන්ධයෙන් උද්ගත වූවකි. **විමති විනොදනිය ලියූ චොළිය කස්සප හිමියන් පෙන්වන හැටියට ථෙරවාද මතය අනුව සුරාපානය නො දැන කළත් එය ලොකවද්‍ය හෙයිනුත් සහජාත චිත්තයෙන් වරදෙහි බැඳීමට අවකාශ ඇති හෙයිනුත් උපසම්පන්නයෙකුට නම් එයින් ඇවැත් සිදු වෙයි. සාමණේරයෙකුට නම් සීල භෙදයක් නො වෙයි. එහෙත් අකුසල් සිදු වෙයි. අභයගිරිකයන් මේ සම්බන්ධයෙන් දරන මතය අනුව නො දැන කරන සුරාපානයෙන් උප-සපන්නයෙකුට ඇවැත් සිදුවීමක් හෝ සාමණේරයෙකුට අකුසල් සිදුවීමක් හෝ නොවෙයි.[16]**

යට දැක් වූ නිදසුන්වලින් පෙනෙන්නේ මහාවිහාරිකයන් සහ අභයගිරිකයන් අතර විනය ප්‍රතිපත්ති සම්බන්ධයෙන් උද්ගත වූ ප්‍රතිවිරුද්ධ මත කීපයකි. එහෙත් සුරාපානය පිළිබඳව අභයගිරිකයන් දරූ මතය මහාවිහාරිකයන් අතර පවා පැතිර තිබූ බව සාරත්ථ දීපනිය ලියූ සාරිපුත්ත මාහිමියන් විසින් එය මහාවිහාරික මතයක් හැටියට පිළිගෙන තිබීමෙන් පෙනේ.[17] එය දුර්මතයක් බව පෙන්වන ලද්දේ විමති විනොදනිය ලියූ චොලිය කස්සප හිමියන් විසිනි.[18] සුරාපානය පිළිබඳව අභයගිරිකයන් දරූ මතය දැන දැන හෝ නොදැන මහාවිහාරිකයන් අතර පිළිගැනීමට භාජන වීමෙන් පෙනෙන්නේ එය මහාවිහාරිකයන් පවා මහලු පැවිද්දට හානි වන තරම් බරපතළ එකක් හැටියට නො පිළිගත් බවයි. යට දැක් වූ අනික් ප්‍රතිවිරුද්ධ මත ගැන බැලීමේ දී අභයගිරිකයන් සමහර අංශවලින් මහාවිහාරිකයන්ටත් වඩා දැඩි විනය ප්‍රතිපත්ති අනුගමනය කළ බව පෙනී යයි. එහෙයින් එවැනි ප්‍රතිපත්ති දුෂ්ප්‍රතිපත්ති හැටියට සලකා අභයගිරිකයන් දුශ්ශීලයන් හැටියට හැඳින්වී යයි සිතීම දුෂ්කරය. ජේතවනිකයන් අනුගමනය කළ විරුද්ධ ප්‍රතිපත්ති මොනවා දැයි පැහැදිලි නැත. මහාවිහාරිකයන්ගේ චෝදනාවලට වැඩි වශයෙන් එල්ල වූයේ අභයගිරිකයන් බව නිකාය භේදය පිළිබඳව ඉතිහාසයේ ඇති වූ ගැටුම්වලින් ද පෙනේ. ජේතවනිකයන් අනුගමනය කළ විනය ප්‍රතිපත්ති ගැන විශේෂ සඳහනක් නො කරන්නේ ඒවා අභයගිරිකයන්ගේ ප්‍රතිපත්ති තරමට මහා විහාර සම්ප්‍රදායෙන් වෙනස් නොවූ හෙයින් විය යුතුය. එසේ නම් අභයගිරිකයන් සහ ජේතවනිකයන් සියලු දෙනාම දුශ්ශීලයන් හැටියට සැලකීමට ඔවුන් අනුගමනය කළ විනය ප්‍රතිපත්ති හේතු වී යයි කීමට ද වැදගත් කරුණක් නො පෙනේ.

දේශපාලන, ආර්ථික බලපෑම් හේතුකොට ගෙන වත් අභයගිරික ජේතවනික නිකායද්වයේ සියලුම භික්ෂූන් අතර දුශ්ප්‍රතිපත්ති ඇති වූයේ නම් එ පමණක් වුවද එම නිකායකයින් සියල්ලම දුශ්ශීලයන් හැටියට හැඳින්වීමට ප්‍රමාණවත් හේතුවක්

වනු ඇත. මහාපරාක්‍රමබාහු රජුගේ නිකාය සමගියට පෙර ශාසනයේ පිරිහීම ඇති කළ දේශපාලන වියවුල් සහ ආර්ථික දුෂ්කරතා[19] භික්ෂූන් අතර දුෂ්ප්‍රතිපත්ති පැතිර යෑමට හේතු වී නම් එය නිකාය භෙද අනුව සිදුවූවක් විය නො හැකිය. අභයගිරි, ජේතවන දෙනිකායේ සියලුම භික්ෂූන් ඊට හසු වී මහාවිහාරකයන්ගෙන් සැලකිය යුතු පිරිසක් හසු නො වීමට හේතු නො පෙනේ. දේශපාලන, ආර්ථික බලපෑම්වලින් මහාවිහාරිකයන්ගෙන් කීප දෙනෙකු නිදහස් වූයේ නම් සෙසු නිකාය දෙකේ ද ඒ ගණයට වැටෙන සුළු පිරිසක් හෝ සිටිය යුතුය. ඒ අනුව වුව ද, අභයගිරි, ජේතවන දෙනිකායේ සෑම භික්ෂුවක්ම දුශ්ශීලයෙක් වී යයි පිළිගැනීම හෝ පිළිගැන්වීම දුෂ්කර කාර්යයකි. සාමාජික බලපෑම් උඩ වුව ද එබඳු වෙනසක් වී යයි පෙන්වීම දුෂ්කරය. එහෙයින් අභයගිරි, ජේතවන දෙනිකායේ සියලුම භික්ෂූන් දුශ්ශීලයන් හැටියට හැඳින්වීම තේරුම් කළ නොහැකි තරම් ය. ඇතැම්විට එම නිකායද්වයේ භික්ෂූන් දුශ්ශීලයන් හැටියට පෙන්වන්නේ වෙනත් හේතුවක් නිසා වන්ට ඇත.

සංඝසාමග්‍රිය ගැන සඳහන් වන සෑම මූලාශ්‍රයකම වාගේ නිකාය භේදය සහ ඒ හේතු කොට ගෙන පැතිර ගිය දුර්මත ශාසනය කෙළෙසීමට හේතු වූ විපත්තිකර දෙයක් බව කියැවෙයි. පොළොන්නරු කතිකාවතේ සංඝසාමග්‍රියට පෙර පැවැති ශාසනික තත්ත්වය හෙළිකරන විස්තරයෙහි ආරම්භයට දක්වන්නේ වළගම්බා රජුගේ කාලයේ සිට ඇති වූ නිකාය භෙදය නිසා ශාසනය පිරිහුණු බවයි.[20] සංඝසාමග්‍රිය පිළිබඳව මහාවංසයේ පළමු විස්තරයෙන් ද එය සනාථ කෙරෙයි. බොහෝ දුර්ලබ්ධි මිශ්‍ර වීම නිසා ශාසනය කලක් තිස්සේ කැලඹීමට පත්වෙමින් තිබූ බවත්, නිකාය වශයෙන් බෙදුණු බඩ රැකගැනීම පරමාර්ථ කොටගත් අලජ්ජින්ගෙන් ගහණ ව තිබූ බවත් එම විස්තරයෙහි සඳහන් වේ.[21] වළගම්බා (අභය) රජුගේ කාලයේ සිට වර්ග බවට පැමිණි අභයගිරිකයන් ද එසේම ජේතවනිකයන් ද මහාසේන රජුගේ කාලයේ ඇති වූ භේදයේ සිට වෛතුල්‍ය පිටකාදිය බුද්ධවචනය හැටියට පැතිර වූ බව සංඝසාමාග්‍රිය පිළිබඳ මහාවංසයේ දෙවන විස්තරයෙහි සඳහන් වේ.[22] නිකාය භේදය නිසා ශාසනය පිරිහුණු බව නිකාය සංග්‍රහය ද කියයි.[23] යට දැක්වූ මූලාශ්‍රාවල නිකාය භෙදයත් ඒ සමගම ඇති වූ දුර්මත පැතිර යෑමත් ශාසනයේ පිරිහීමට හේතු වූ සාධකයක් හැටියට පිළිගෙන ඇත. එකී දුර්මත, විනය සම්බන්ධයෙන් මෙන් ම ධර්මය සම්බන්ධයෙන් ද යන දෙයාකාරයෙන්ම පවතින්ට ඇතැයි අනුමාන කළ හැකිය. අභයගිරි, ජේතවන දෙනිකාය අනුගමනය කළ විනය ප්‍රතිපත්ති පිළිබඳව ඉහතින් සාකච්ඡා කර ඇති හෙයින් ඔවුන් විනය සම්බන්ධයෙන් දැරූ ප්‍රතිවිරුද්ධ මත ගැන අල්පමාත්‍ර අවබෝධයක් එමඟින් ලබාගත හැකි වනු ඇත. ධර්මය සම්බන්ධ වෙනස්කම් ද මහාවිහාරිකයන් සහ අනික් නිකාය දෙක අතර තිබෙන්ට ඇත. ''ධර්මය සම්බන්ධයෙන් අභයගිරිකයන් දැරූ ප්‍රතිවිරුද්ධ මත කීපයක් අභිධම්මත්ථ විකාසිනියෙන් සහ විශුද්ධි මාර්ග සන්නයෙන් හෙළි වෙයි.

පුණ්‍ය ක්‍රියා වස්තු සම්බන්ධයෙන් මහාවිහාරිකයන් දරන මතය අභයගිරිකයන්ගෙන් වෙනස් වන හැටි අභිධම්මත්ථවිකාසිනියෙහි පෙන්වා ඇත. මේ සම්බන්ධයෙන් මහාසාංඝිකයන් දරන්නේත් අභයගිරි මතයමයි. **අභයගිරිකයන්ගේ පිළිගැනීම අනුව දාන, සීල, භාවනා, සංයුති, දෙසනා, අනුස්සති, මොද, වෙයාාවච්ච, පූජා, සරණ, පත්ති සහ පසංසා වශයෙන් පුණ්‍ය ක්‍රියා වස්තු දොළසක් වෙයි. මහාවිහාරිකයන්ගේ ලැයිස්තුවෙහි පුණ්‍ය ක්‍රියා වස්තු දශයෙකි; එනම් දාන, සීල, භාවනා, පත්තිදාන, වෙයාාවච්ච, දෙසනා, අනුමොදනා, දිට්ඨුජ්ජුකම්මය, සංසුති සහ අපචායනය යන මේවා ය. අභයගිරිකයෝ එහි දිට්ඨුජ්ජුකම්මය අත්හැර අත්තනාකත පුඤ්ඤානුස්සරණ (අනුස්සති), බුද්ධාදිසරණාගමන (සරණ), පරගුණප්පසංසා (පසංසා) යන අංග තුන එකතු කරති.**[24]

අභිධම්මත්ථවිකාසිනිය අනුව ඉස්සා. මච්ඡරිය දෙකේ හටගැනීම් සම්බන්ධයෙන් ද අභයගිරික මතය මහාවිහාරික මතයෙන් වෙනස් වෙයි. අභයගිරික මතය අනුව ඊර්ෂ්‍යාව සහ මසුරුකම අවස්ථානුකූලව හෝ යෙදෙන පරිද්දෙන් එකට උපදී. මහාවිහාර මතය අනුව ඊර්ෂ්‍යාව සහ මසුරුකම එකට නූපදී. ඊර්ෂ්‍යාව අන්‍යයන්ගේ සම්පත් විෂය කොටත් මසුරුකම අන්‍යයන්ට සාධාරණ නොවූ තමන් ගේ සම්පත් විෂය කොටත් උපදින හෙයිනි.[25]

ධුතාංග සම්බන්ධයෙන් අභයගිරිකයන් හා මහාවිහාරිකයන් අන්‍යෝන්‍ය ප්‍රතිවිරුද්ධ මත දෙකක් ප්‍රකාශ කර තිබෙන සැටි විශුද්ධිමාර්ග සන්නයෙන් හෙළිවේ. අභයගිරික මතය අනුව ධුතාංගය කුශලත්‍රිකයෙන් තොර වූ ප්‍රඥප්ති මාත්‍රයක් පමණි. පරමාර්ථ වශයෙන් ධුතාංග කියා දෙයක් නැත. නැති දෙයකින් කෙලෙස් නැසීමක් විය නොහැකිය. මහාවිහාර මතය: අභයගිරිකයන් ධුතාංග යන වචනය විවරණය කරන අන්දමට ධුතගුණ සමාදන් වේය යන ව්‍යවහාරය පවා සදෙස් වෙයි. පරමාර්ථ වශයෙන් අවිද්‍යාමාන දෙයක ගුණ වශයෙන් පෙන්විය හැකි යමක් තිබිය නොහැකි හෙයිනි. ධුතාංග සමාදන් වීම ප්‍රඥප්තියක් වශයෙන් ගැනීමේදී මෙහි දක්වූ දෙස්වලට එය හසුවන බැවින් අභයගිරික මතය නොපිළිගත යුතුයි.[26]

මාර්ගඵල අධිගමය සම්බන්ධයෙන් මහාවිහාර, අභයගිරි දෙනිකාය අතර පැවති මතභෙදයක් ද විශුද්ධිමාර්ග සන්නයේ එයි. අභයගිරිකමතය : සොතාපන්නයා පලසමවතට සමවැදීම සඳහා විදර්ශනා වැඩුවහොත් ඔහු සකෘදගාමී වෙයි. සකෘදගාමියා අනාගාමිවෙයි. ඒ අනුව එක් (ධ්‍යාන) සමාපත්තියකට සමවැද විදර්ශනා වැඩීමෙන් වෙනත් ඵලයක් ලැබිය හැකි ය. මහාවිහාර මතය අනුව, එක් අරමුණක් සඳහා විදර්ශනා වැඩීමෙන් ඉන් වෙනස් අරමුණක් ලැබිය නොහැකිය. එසේ වුවහොත් අනාගාමියා රහත්විය යුතුය. රහතුන් වහන්සේ පසේ බුදු විය යුතුය. එවැන්නක් සිදු විය නොහැකි හෙයින් ඔවුන්ගේ මතය පිළිගත නොහැකිය. ප්‍රථම ධ්‍යාන, ද්වීතියධ්‍යාන වශයෙන් යම් ධ්‍යාන මාර්ගයකට පිළිපන් තැනැත්තාට එහිම ඵලය මිස වෙනත් ඵලයක් නොලැබෙ.

අභයගිරිකයන් ධර්මය සම්බන්ධයෙන් දරූ ප්‍රතිවිරුද්ධ මත පිළිබඳ තරමක අවබෝධයක් යට දක්වුණු නිදර්ශනවලින් ලබාගත හැකි වනු ඇත. නිකායභේදය, හේතුකොට ගෙන දුර්මත ඇති වි යයි කීමට එක් හේතුවක් එවැනි අදහස් අභයගිරිකයන් විසින් පතළ කර හැරීම විය හැකිය. මේවා, සාමාන්‍යයෙන් අභයගිරිකයන්ගෙන් ප්‍රභව වූ ප්‍රතිවිරුද්ධ මත ලෙස සැලකීමට පුළුවන. වෛතුල්‍ය නමින් හැඳින්වෙන දුර්මත කොටසක් ද අභයගිරි, ජේතවන දෙනිකාය විසින් බුද්ධභාෂිත හැටියට ප්‍රකාශ කළ බව මහාවංසය කියයි.[28] මෙම නිකාය දෙක වරින් වර දඹදිවින් පැමිණි වෛතුල්‍ය ධර්ම පිළිගත් බව මහාවංසයෙන් සහ නිකාය සංග්‍රහයෙන් පෙනෙන හෙයින්[29] වෛතුල්‍ය නමින් හැඳින්වෙන්නේ එකී නිකාය දෙකෙන් ප්‍රභව නො වූ බැහැරින් පැමිණි, ''දුර්මත'' විය හැකියි. පුණ්‍යක්‍රියා වස්තු සම්බන්ධයෙන් මහාවිහාරිකයන් දරන මතය අභයගිරිකයන්ගෙන් වෙනස් වන බව කියන අභිධම්මාවතාර ටීකාව, මහාසාංඝිකයන් දරන්නේත් අභයගිරික මතයම බව පෙන්වයි.[30] නිශ්චය වශයෙන් කීමට තරම් ප්‍රබල සාධක නැති වුවත් අභයගිරිකයන් පුණ්‍ය ක්‍රියා දෙළොසක් පැනවූයේ මහාසාංඝික බලපෑම් උඩ බව අනුමාන කළ හැකියි.

1 සේන (ක්‍රි.ව. 833--53) රාජ්‍ය කාලයේ මහාසාංඝිකයන් ලක්දිව ප්‍රබල පිරිසක් වශයෙන් සිටින්නට ඇති බව අනුමාන කළ හැකි සාධක තිබේ. අභයගිරියේ වීරාංකුරාරාමයේ එම නිකායිකයින් පදිංචිවසිටි බව මහාවංසය කියයි.[31] එසේ නම් අභයගිරිකයන්

මහා සාංඝිකයන් හා කිට්ටු සම්බන්ධයක් ඇතිව සිටින්ට ඇති බවත් ඔවුන් මහාසාංඝික මතවලින් ප්‍රභාවිත වන්ට ඇති බවත් සිතිය හැකි ය. ඒ අනුව අභයගිරිකයන් පිළිගත් පුණ්‍යක්‍රියා වස්තු දෙළොයෙහි ආදි කර්තෘන් මහාසාංඝිකයන්වන්ට ඇත. අභයගිරිකයන් සහ ජේතවනිකයන් විසින් බුද්ධභාෂිත නොවූ වෛතුල්‍ය පිටක ආදිය බුද්ධභාෂික හැටියට පතුරුවන ලදයි මහාවංසය කියන්නේ ඒ ගණයට වැටෙන මත පැතිරවීම ගැන විය හැකියි.

වෛතුල්‍ය නමින් හැඳින්වෙන දුර්මත වොහාරතිස්ස රාජ්‍ය කාලයේ සිට අසන්ට ලැබෙතත් එය මහාසේන රජුගේ කාලයේ සිට දැඩි ස්වරූපයක් ගන්ට ඇති බව මහාවංස විස්තරයෙන් හෙළි වේ.[32] මෙම ''දුර්මත'' ශාසනයේ පිරිහීමට ප්‍රබල හේතුවක් වන්ට ඇති බව මහාවංසයෙන් මෙන් ම යට සඳහන් කළ මූලාශ්‍රවලින් ද හෙළි කෙරෙයි. භින්නලබ්ධික නිකායවල සියලුම භික්ෂූන් දුශ්ශීලයන් හැටියට හඳුන්වා ශොධනයට භාජන කිරීමට හේතුව ඇතැම් විට, එම භික්ෂූන් දුශ්ශීලයන් වීම ම නොව, මහාවිහාරය හා අනෙක් නිකාය අතර පැවති ප්‍රතිවිරුද්ධ මත මුල් කරගෙන ඒවා අතර පැවති අසහනය විය යුතුයි. භින්නලබ්ධික නිකායවල භික්ෂූන් දුශ්ශීලයන් හැටියට හඳුන්වා ශෝධනයට භාජන කරන්ට ඇත්තේ එනිසා වන්ට ඇත. එහෙත් අඹුදරුවන් පෝෂණය කිරීම ආදී දුෂ්ප්‍රතිපත්ති මුල් කර ගෙන ශෝධනයට භාජන කළ භික්ෂු පිරිසක් ද වූහ. මහාවංසය අනුව පෙනෙන්නේ එබඳු භික්ෂූන් සෑම නිකායකම වූ බවයි.[33]

මේ අනුව සංඝසාමග්‍රිය ප්‍රධාන කරුණු දෙකක් මුල් කරගෙන සිදු කර ඇති බව පෙනේ. එනම් භික්ෂූන් අතර දුෂ්චරිත පැතිර යෑම සහ දුර්මත (දුල්ලද්ධි) පැතිර යෑමයි. දුශ්චරිතවල නියැලුණු ශ්‍රමණ ප්‍රතිරූපකයන් ශෝධනයට භාජන කිරීම සලකා බලන විට එයට විනය ප්‍රතිපත්ති මුල් වූ බව සිතිය හැකිය. දුර්මතවලින් කොටසක් ද මේ ගණයට වැටෙන බව යට දක්වූ විමර්ශනයෙන් පෙන්වා ඇත. එහෙත් දුර්මත සියල්ලම විනය සම්බන්ධ ප්‍රශ්න විය නො හැකිය. විශේෂයෙන්, වෛතුල්‍ය නමින් හැඳින්වෙන දුර්මත ධර්මයේ වැදගත් කාරණා සම්බන්ධව පැනනැගුණු ඒවා ලෙස අනුමාන කළ හැකි වෙයි.

සංශෝධනය කිරීම සඳහා විනිශ්චය මණ්ඩලයට පත් කරනු ලැබූ සාමාජිකයන්ගේ සුදුසුකම්, විනිශ්චය දීමට අවශ්‍ය වූ ඒවා හැටියට සැලකිය හැකි නම් එයින් වුවද දුෂ්ප්‍රතිපත්ති සහ දුර්මත පැතිරී යෑම සංඝසාමග්‍රියේදී සැලකිල්ලට භාජන වූ කරුණු හැටියට අනුමාන කළ හැකිය. ඇවැත් සිදුවීම සහ නොවීම පිළිබඳ ව ගැඹුරට දැන සිටියා වූත් විනයඥනයක් ලැබුවා වූත්, භික්ෂූන් විනිශ්චය මණ්ඩලයට අයත් වූ බව සංඝසාමග්‍රිය පිළිබඳ පළමු විස්තරයෙන් හෙළි වෙයි.[34] විනයඥනයක් ඇති භික්ෂූන් විනිශ්චය මණ්ඩලයට අයත් වූ බව සංඝසාමග්‍රිය පිළිබඳ දෙවන විස්තරයෙන් ද හෙළිවෙයි. ප්‍රධාන විනිශ්චකයන් වහන්සේ හැටියට සැලකිය හැකි මහාකාශ්‍යප මහාස්ථවිරයන් ගැන සඳහන් කරන දෙවන විස්තරයෙහි උන්වහන්සේ විනය පිළිබඳ විශේෂ ඥනයක් ඇත්තෙකු බව සඳහන් වේ.[35] ඒ අනුව සංඝසාමග්‍රියේ දී විනය පිළිබඳ ප්‍රශ්න සැලකිල්ලට භාජන වන්ට ඇති බව පෙනේ. එහෙත් විනිශ්චය මණ්ඩලයට අයත් වූ භික්ෂූන්ගේ සුදුසුකම් දක්වා තිබෙන්නේ විනය සම්බන්ධයෙන් පමණක් ම නො වේ.

සංඝසාමග්‍රිය පිළිබඳ දෙවන විස්තරයේ මහාකාශ්‍යප මහාස්ථවිරයන් ගැන කෙරෙන වර්ණනාවෙහි උන්වහන්සේ විනය විශාරදයෙකු හැටියට මෙන්ම ත්‍රිපිටකධාරියෙකු හැටියට ද හඳුන්වා ඇත.[36] සම්පූර්ණ විනිශ්චය මණ්ඩලය ගැන සඳහන් කරන විට ද ඊට සහභාගි වූ භික්ෂූන් ත්‍රිපිටකධාරීන් බව කියා ඇත.[37] ඒ අනුව විනිශ්චය මණ්ඩලයේ භික්ෂූහු විනයධරයන් වශයෙන් මෙන්ම ත්‍රිපිටකධරයන් වශයෙනුත් සුදුසුකම් ලද්දෝය.

භික්ෂූන් අතර තිබූ දුෂ්ප්‍රතිපත්ති සම්බන්ධයෙන් විනිශ්චය ක් දීමට විනය ඥනයක් තිබිය යුතුය. දුර්මත පිළිබඳ විනිශ්චයක් දීමට ත්‍රිපිටකය ගැඹුරට දැන සිටිය යුතුය. මේ අනුව වුව ද දුෂ්ප්‍රතිපත්ති සහ දුර්මත පැතිරී තිබීම සංඝසාමග්‍රියට හේතු වූ ප්‍රධාන කරුණු දෙකක් හැටියට අනුමාන කිරීමට ඉඩ තිබේ.[38] නිකාය සංග්‍රහය, සද්ධර්මරත්නාකරය සහ දළද පූජාවලිය අනුව සංඝසාමග්‍රිය සිදු කරන අවස්ථාව වන විට නිකාය සතරක් විය. එනම් මහාවිහාර (ථෙරිය), ධර්මරුචි (අභයගිරි), සාගලිය (ජේතවන) සහ වෛතුල්‍ය යන මේවායි.[39] මහාවංසයෙහි සඳහන් වන්නේ මෙහි මුලින් දක්වූ නිකාය තුන පමණයි.[40] වෛතුල්‍ය නමින් වෙනම නිකායක් සඳහන් නො කරන මහාවංසය වෛතුල්‍යවාදය හා සම්බන්ධ කොට පෙන්වන්නේ අභයගිරි, ජේතවන දෙනිකායම යි[41].

සංඝසාමග්‍රිය සිදු කළ අවස්ථාව වන විට පැවති නිකාය ගණන පිළිබඳව ප්‍රතිවිරුද්ධ මත තිබුණත් සැම මූලාශ්‍රයකම සමගි කළ හැටියට සඳහන් වන්නේ නිකාය තුනක් පමණි. පොළොන්නරු කතිකාවත සහ මහාවංසය අනුව නිකාය තුන හැඳින්වෙන්නේ මහාවිහාර, අභයගිරි සහ ජේතවන යන නම්වලිනි. යට දක්වූ අනික් මූලාශ්‍රවල ''සමඟ'' කළ බව කියන්නේ ධර්මරුචි , සාගලිය සහ වෛතුල්‍ය යන නිකාය තුනයි. ඒ අනුව මහාවිහාර නිකාය තුන් නිකා සමඟියට අයත් නොවේ. මෙම ගැටළුව විසඳීම එතරම් පහසු කාර්යයක් නොවෙයි.

මහාවිහාරිකයන් ශෝධනයට භාජන කළ බව කියන්නේ මහාවංසය පමණි.[42] මහාවිහාර නිකායට අයත් කීප දෙනෙකු සසුනෙන් පහ කළත් මහාවිහාර සම්ප්‍රදය අභාවයට නොගොස් තවදුරටත් පැවති නිසා සංඝසාමග්‍රිය ගැන සඳහන් කරන ඇතැම් සම්ප්‍රදයන්හි එම නිකාය ශෝධනයට භාජන කළ එකක් හැටියට නො සලකන්ට ඇත. නිකාය සංග්‍රහය ආදී මූලාශ්‍රවල මහාවිහාර නිකාය ''සමඟ'' කළ නිකායක් වශයෙන් නො පෙන්වන්නේ එය දුශ්ශීලයන් නිසා නො කෙළසුණු නිකායක් හැටියට පිළිගත් නිසා වන්ට ඇත. සමගි කිරීමෙන් සිදු කළ ප්‍රධාන කාර්‍යය වූයේ දුශ්ශීලයන් සසුනෙන් පහකිරීම සහ සාමණේර තත්ත්වයට පහත හෙළීමයි. ඇතැම් මූලාශ්‍රවල මහාවිහාර නිකාය සමගි කළ එකක් වශයෙන් නොසැලකුවේ එවැනි සමගියකට මහාවිහාරය හසු වී යයි කීම මදිකමක් හැටියට සලකා විය හැකියි. එහෙත් නිකාය තුනක් සමගි කළ බව සැම මූලාශ්‍රයකම එක සේ පිළිගෙන ඇත. මහාවිහාරය සමඟි කළ නිකායක් හැටියට නො ගෙන අත්හළහොත් නිකාය තුන සම්පූර්ණ නො වේ. නිකාය තුන සම්පූර්ණ වීමට නම් එයට තවත් නිකායක් තිබිය යුතුය. ඇතැම් විට, වෛතුල්‍ය නිකාය ඊට ඇතුළත් කළේ එහෙයින් විය යුතුය.

මහාවිහාරය, අභයගිරිය, ජේතවනය යන නිකාය තුන ථෙරවාද සම්ප්‍රදය තුළ ලංකාවේ දී ම බිහි වූ නිකාය තුනකි. බොහෝ පෙර සිට ඒවා අතර නොයෙක්වර ගැටුම් ඇති විය. මෙම නිකාය තුන පමණක් සමගි කළේ නම් එසේ කිරීමට හේතුව, ඒවා ථෙරවාද සම්ප්‍රදය තුළ වැඩුණු, ලංකාවේ දී බිහි වූ නිකාය යන තර්කය කෙනෙකුට ඉදිරිපත් කළ හැකිය. එසේ නම් හතරවන නිකාය ශෝධනය නො කළ බව කියන්නේ එය ඒ ගණයට නො වැටෙන හෙයිනි. එහෙත් සංඝසාමග්‍රිය අවශ්‍ය වූයේ සසුන පිරිහෙමින් පැවැති නිසා නම් එම නිකාය ශෝධනය නො කිරීමෙන් සංඝසාමග්‍රිය කිරීමට මුල් වූ පරමාර්ථ ඉටු නො වෙයි. එය ථෙරවාද නො වූ සම්ප්‍රදයකට අයත් භින්නලබ්ධික නිකායක් වන හෙයිනි. වෛතුල්‍යවාදීන් ලක්දිවට පැමිණි මුල් අවස්ථාවල දී අභයගිරි, ජේතවන දෙනිකාය සමඟ පැවැත් වූ සම්බන්ධතා මේ වන විට කෙසේ පැවතියේ ද යන බව පැහැදිලි නොවේ. මේ වන විටත් මුල දී පැවැති අන්දමේ සම්බන්ධයක් තිබුණේ නම් වෛතුල්‍යවාදී භික්ෂූන් වෙනම නිකායක් වශයෙන් නො ගෙන අභයගිරි, ජේතවන

නිකාය දෙකට අයත් හැටියට ම සලකා ඔවුන් ශෝධනයට භාජන කළ බව මහා වංසයෙන් සහ පොළොන්නරු කතිකාවතෙන් හෙළි කරතැයි සිතිය හැකි ය. හතරවන නිකාය සමඟි කළ නිකායක් හැටියට නිකාය සංග්‍රහය සහ ඒ අනුව ගිය අනික් මූලාශ්‍රවල සඳහන් කරන්නේ එය වෙනම නිකායක් වශයෙන් පිළිගත් සම්ප්‍රදයක් අනුව යෑම නිසා වන්ට ඇත.

පරාක්‍රමබාහු රජතුමා මෙම සංඝසාමග්‍රිය සිදු කළේ අශෝක රජුගේ ශාසන ශෝධනය අනුව බව පොළොන්නරු කතිකාවතින් හෙළි වේ. ඒ අනුව මොග්ගලිපුත්තතිස්ස හිමියන් වහල් කොට ශාසන සංශෝධනය කළ අශෝක රජු මෙන් මහාපරාක්‍රමබාහු රජතුමා ''මහාකාශ්‍යප මහාස්ථවිරයන් ප්‍රමුඛ මහාවිහාරවාසී භික්ෂු සංඝයා වහල් කොට'' පාපි භික්ෂූන් නිර්මථනය කළේය.[43] අශෝක රජු ශාසන ශෝධනය කළේ බුදුසසුන කිළිටි කරමින් සිටි සියලුම මිථ්‍යා මතධාරීන් සසුනෙන් අපගත කිරීමෙනි. ඉන්පසු සංඝයා සමඟි වූහ.[44] මෙම සංඝසාමග්‍රිය ශාසන ශෝධනයයේ ම ප්‍රතිඵලයකි.

මහාපරාක්‍රමබාහුගේ සංඝසාමග්‍රියත් ඊට සමාන බව පෙනේ. මෙම රජතුමා සංඝසාමග්‍රිය කළේ සංඝශෝධනයක් කිරීමෙනි. එම සංඝශෝධනයයේ දී සසුන කිළිටි කරමින් සිටි දුශ්ශීලයන් සහ දුර්මතධාරීන් කීප දෙනෙකු උපවැදි කරවා තවත් කීප දෙනෙක් සාමණේර බවට පත්කරනු ලැබූහ.[45] එහිදී මහාපරක්‍රමබාහු රජතුමා අශෝක මෙන් සසුන කිළිටි කරමින් සිටි සියලුම පුද්ගලයන් ශාසනාපගත නො කළේය. එහෙත් මහාපරක්‍රමබාහු යෙදූ පිළියම් නිසා භින්නලබ්ධික බලය මර්දනය විය. සංඝ සාමග්‍රිය සිදු වූයේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. ඒ අනුව මහාපරාක්‍රමබාහු රජතුමා සංඝසාමග්‍රිය සිදු කරන්නට ඇත්තේ අශෝක රජතුමාගේ සංඝසාමග්‍රිය අනුකරණය කිරීමෙන් බව පෙනේ.

මහාපරාක්‍රමබාහු රජතුමාගේ සංඝසාමග්‍රිය ගැන අදහස් පළකර ඇති ඇතැම් උගතුන් එය විවරණය කරන්නේ ප්‍රධාන නිකාය තුන වූ මහාවිහාර, අභයගිරි, සහ ජේතවන යන මේවා අතර එකමුතු කමක් ඇති කළ එකක් හැටියටයි.[46]

සංඝසාමග්‍රියෙන් පසු අභයගිරි, ජේතවන නිකාය දෙකට අයත් භික්ෂූන්ගෙන් කීපනමකට සාමණේරව සිටින්ට ඉඩ තැබුවත් එපමණකින් ඒ නිකාය දෙක නීත්‍යානුකූලව පිළිගැනීමකට ඉඩක් නො විය. එයට හේතුව අංග සම්පූර්ණ භික්ෂූන් ඒවායේ නො සිටීමයි. උපසම්පදව ලැබ අංග සම්පූර්ණ භික්ෂූන් බවට පත්වීමට නම්, ඔවුන් මහාවිහාර පාර්ශ්වයෙහි උපසම්පදව ලැබිය යුතු විය.[47] එයින් සිදු වූයේ සෙසු නිකාය මහාවිහාර නිකාය විසින් ගිලගනු ලැබීමයි; නැතහොත් මහාවිහාර නිකාය යටතට පත්කොට ඒවායේ ස්වෛරීත්වය නැතිකර දැමීමයි. එය සෙසු නිකායන් මහාවිහාර නිකායට ඈඳීමක් හෝ එක් කිරීමක් හැටියට ද විවරණය කළ හැකි ය. පොළොන්නරු කතිකා වතේ ''තුන් නකා සමඟ කිරීමෙන් එක් නකාකොටැ''[48] යන පාඨයෙහි ''සමඟ'' යන වචනයෙන් අභ වන්නේ එය විය හැකියි. මින්පසු නිකායක් වශයෙන් සංවිධානය වන්ට ඉඩ ලැබුණේ මහාවිහාරිකයන්ට පමණි. යට දක් වූ පාඨයෙහි ''එක් නකා කොටැ'' යන්නෙන් අභවන්නේ එය බව පෙනේ. එසේ නම් මහාපරාක්‍රමබාහුගේ නිකාය සමඟි යෙන් සිදු කර තිබෙන්නේ සමඟිය යන වචනයෙන් බලාපොරොත්තු විය හැකි අන්දමට නිකාය අතර එක මුතුවක් ඇති කිරීම නොව සෙසු නිකායන් මහාවිහාරයට එක්කොට හෝ එය යටතට ගෙන මහාවිහාර නිකාය පමණක් නීත්‍යානුකූලව පිළිගැනීමට කටයුතු සැලැස්වීමයි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වළගම්බා රාජ්‍ය කාලයේ සිට පැවැති සාම්ප්‍රදායික නිකාය භේදය සමථයකට පත් විය. සාමාන්‍ය ව්‍යාහාරයෙහි මෙය තුන් නිකා සමගිය නමින් හඳුන්වනු ලැබේ.

මෙහිදී විමසා බැලිය යුතු තවත් වැදගත් කරුණක් නම් නිශ්ශංකමල්ල රජතුමා (ක්‍රි.ව. 1187–96) විසින් ද තුන් නිකාය සමගි කරනු ලැබූ බව කියා ගැනීමයි[49]. මෙහි සත්‍යයක් තිබේ නම්, මහාපරාක්‍රමබාහු රජුගේ තුන් නිකා සමගිය අසාර්ථක වූ බව පිළිගන්ට සිදු වේ. ඇත්ත වශයෙන්ම නිශ්ශංකමල්ල රජු විසින් නිකාය සමගිය කරන ලද නම් එය කීප අතකින් වැදගත් විය යුතුය. එක් අතකින් පළමු තිබූ නිකාය භෙදය ගැන ඉන්පසු අසන්ට නොලැබෙන හෙයින් එම සමගි කිරීම සාර්ථක වූ බව පිළිගන්ට සිදු වෙයි. අනික් අතින් නිකායභෙදය හේතු කොටගෙන යම්කිසි පිරිහීමක් වූයේ නම් එම භෙදය නැතිව යැමෙන් පිරිහීමට තිබූ ඉඩකඩ බොහෝ දුර නැතිව යැමට ඉඩ තිබිණ. තවත් අතෙකින් ඒ තාක් කිසිම රජෙකුට සාර්ථක කරගත නො හැකි වූ කාර්‍යයක්, සාර්ථක කර ගැනීමෙන් ශාසන ඉතිහාසයේ නො මැකෙන නමක් ඇති කිරීමට ඔහු පමණක් සමර්ථ වූ බව පිළිගන්ට සිදු වේ. මේ අන්දමට කීප අතකින් වැදගත් වන්ට ඉඩ තිබූ මෙබඳු සිද්ධියක් ගැන නිශ්ශංකමල්ලගේ දඹුලු ලිපිය හැර අන් කිසිම මූලාශ්‍රයක සඳහන් නොවීම පුදුම එළවන සුලු ය.

නිශ්ශංකමල්ල බුද්ධාගමට අනුග්‍රහ දක්වූ රජුන් අතරින් ශ්‍රේෂ්ඨ තැනක් හිමි කර ගන්නා රජෙකු බව ඔහුගේ බෞද්ධ කටයුතු පිළිබඳව ලියැවුණු සෑම මූලාශ්‍රයකම එක සේ පිළිගෙන ඇත. ඒ අනුව ඔහු සිදු කළ හැටියට පෙන්වන නිකාය සමගිය ඇත්ත වශයෙන්ම සිදු වී නම් පසුව සිටි ලේඛකයෝ එය නො සලකා හරිතියි සිතීම දුෂ්කරය. නිශ්ශංකමල්ල රජු තමා කළ හැටියට කියා ගන්නා ඇතැම් දේ පිළිබඳ කර්තෘත්වය ඇත්ත වශයෙන් ම ඉන් පෙර සිටි වෙනත් රජුන්ට පැවරෙන බවත් ඇතැම් දේ බීජමාත්‍ර සත්‍යයක් වටා ගෙතුණු අතිශයෝක්ති හැටියට පිළිගෙන ඇති බවත් ඉතිහාසය හදරන්නන්ගේ සැලකිල්ලට යොමු වී ඇති කරුණකි. නිශ්ශංක සමුද්‍රය නමින් වැවක් මෙම රජතුමා කර වූ බව සඳහන් ව ඇත. එය දැන් පරාක්‍රමබාහු සමුද්‍රය හැටියට හඳුනා ගෙන තිබේ. පරාක්‍රම සමුද්‍රය කරවන ලද්දේ මහාපරාක්‍රමබාහු රජු විසිනි. නිශ්ශංක මල්ල රජු එය කර වූ හැටියට කියා ගන්නේ එහි ප්‍රතිසංස්කරණ කටයුතු කළ නිසා විය හැකිය.[50] පාඬි විජයකුලම වැව සහ හැටදාගෙය එක දිනයක දී නිමකර වූ බව කීම[51] පාඬි, සොළී, රටවල් ජයගත් බව සහ ඒවායින් පඬුරු ගත් බව කීම, ගෞඩ, කර්ණාට නෙල්ලූරු, කාලිංග, කිලිංග, ගුර්ජර, අරමණ, කම්බෝජ යන රටවල් සිය කැමැත්තෙන් නිශ්ශංකමල්ල හා මිත්‍රසන්ථාන ඇති කළ බව සහ එසේ මිත්‍රසන්ථාන නො කැමැති වූ රටවලට බිය එළවා ඒ රටවලින් රාජකුමාරිකාවන් සහ පුදපඬුරු ගෙන්වා ගත්බව කීම යන මේවා බීජමාත්‍ර සත්‍යයක් වටා ගෙතුණු අතිශයෝක්ති හැටියට සැලකිය හැකි ය.[52]

මේ අන්දමට විශ්වාසය ඉක්මවා පවතින තරමේ ජයග්‍රහණ සහ ආශ්චර්‍යමත් දේ නිශ්ශංකමල්ල රජු විසින් කරන ලද බව ඔහු කියා ගන්නේ මහාපරාක්‍රමබාහු රජුට වඩා ඉහළින් කැපී පෙනීමට උත්සාහ කළ හෙයින් විය යුතු ය. නිකාය සමගි කළ බව කියන්නේත් මීට වැඩි අදහසකින් නො වන බව යට දක්වූ කරුණු අනුව සිතීමට ඉඩ තිබේ.

මහාපරාක්‍රමබාහු රජතුමා නිකාය භේදය සමථයකට පත් කළත් නිකායභේදයට මුල්වූත්, එය මුල්කරගෙන වැඩිදියුණුවූත්, අන්‍යොන්‍ය ප්‍රතිවිරුද්ධ මත නිකාය භේදය නැති කිරීමත් සමඟ අභාවයට ගිය බවක් නොපෙනේ. යට දක් වූ පරිදි, සාරිපුත්ත හිමියන් ලියූ සාරත්ථ දීපනියෙහි දක්වෙන ''නො දුන කරන සුරාපානයෙන් ඇවැත් සිදු නො වේය'' යන්න අභයගිරික මතයක් බව වෝලිය කස්සප හිමියෝ පෙන්වති.[53] සාරත්ථදීපනිය නිකාය සමගියට පසුව ලියන ලද බව නිකාය සමගිය ගැන එහි සඳහන් වීමෙන් පෙනේ.[54] එසේ නම් නිකාය සමගියට පසුව අභයගිරික මත පිළිගත් අය සිටි බවට එය සාධකයකි.

ක්‍රි.ව. 15 වන සියවසේ ජීවත් වූ තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් ලියන ලද කාව්‍යශේඛරයෙහි පුණ්‍යක්‍රියා වස්තු දෙළසක් දක්වා ඇත. අභිධම්මාවතාර ටීකාව අනුව මහාවිහාරිකයන් පිළිගත්තේ පුණ්‍යක්‍රියා දශයෙකි. පුණ්‍යක්‍රියා දෙළසක් බව අභයගිරිකයෝ පෙන්වති. ශ්‍රී රාහුල හිමියන් පිළිගෙන ඇත්තේත් දෙළසක් වශයෙන් දක් වූ අභයගිරික මතයම යි.[55] මේ අනුව නිකාය සමගි කිරීමෙන් මහාවිහාර නොවූ නිකායන් අභාවයට පත් කළත්, එම නිකායිකයන් දරූ මතවාද මර්දනය කිරීම සම්පූර්ණයෙන් සාර්ථක නොවූ බව පිළිගන්ට සිදු වේ. මහාවිහාරිකයන් භින්නලබ්ධික මත මැඩලීමට කොතරම් උත්සාහ කළත් මහාවිහාර රාමුව තුළ ඒවා නිදැල්ලේ වැඩී ගිය බව එයින් පෙනෙයි. මෙයින් හෙළිවන, වැදගත් කරුණක් නම් මුලදී නිකාය අතර පැවැති මතවාද සහ ගැටුම් නිකාය සමගිය සිදු කළ අවස්ථාව වන විට අඩු වී ඔවුනොවුන් සහනශීලව ක්‍රියාකළ බවයි. මෙම සහන ශීලතාවය නිකාය සමගිය කෙරෙහි සුළු වශයෙන් හෝ බලපාන්ට ඇති බවත් එය ක්‍රි.ව. 9 වෙනි සියවසේ පමණ සිට ගොඩ නැගෙමින් පැවැති බවත් පෙනේ.

ක්‍රි.ව. 9 වෙනි සියවසේ පමණ සිට ශ්‍රී ලංකාවේ පැවැති ප්‍රධාන නිකාය අතර එකමුතුවක් ඇතිවෙමින් පැවති බව සෙල්ලිපිවලින් සහ මහාවංසයෙන් හෙළි වෙයි. අක්ෂර විද්‍යාව අනුව 9 වෙනි සියවසේ මුල් භාගයට අයත් ලෙස සැලකෙන ජේතවනාරාම සංස්කෘත සෙල්ලිපිය අනුව එක නිකායකින් විසිපහ බැගින් සතර මහ නිකායෙන් සියක් නමක් ජේතවනාරාමයෙහි විසූ බව සඳහන් වෙයි.[56] මෙහි දක්වෙන නිකාය හතර ගැන මත භේද පවතී.[57] එහෙත් එම නිකාය හතරට ශ්‍රී ලංකාවේ අතීතයේ සිට මුල් බැසගෙන තිබූ ප්‍රධාන නිකාය තුන වන මහාවිහාර, අභයගිරි සහ ජේතවන යන නිකාය අයත් වන්ට ඇතැයි අනුමාන කළ හැකියි. හතර වන නිකාය වෛතුල්‍ය, වාජිරිය ආදී නම්වලින් හැඳින්වෙන එකල පිළිගැනීමට පත් නිකායක් විය හැකි ය. 1 සේන (ක්‍රි.ව. 833—853) රජතුමා අභයගිරියෙහි වීරාංකුරාමය කරවා මහාසාංඝික භික්ෂූන්ට සහ ථෙරිය භික්ෂූන්ට පූජා කරන ලද බව මහාවංසයෙහි සඳහන් වේ.[58] ථෙරිය යන විශේෂණය විශේෂයෙන් මහාවිහාරිකයන්ටත් සාමාන්‍යයෙන් අභයගිරිකයන්ට සහ ජෙතවනික-යන්ටත් යෙදිය හැකි බව පෙනේ. ඒ අනුව ථෙරිය යන විශේෂණය යට දක් වූ නිකාය තුනම සඳහා යොදන ලදද නැතහොත් ඉන් එකක් හෝ දෙකක් සඳහා යොදන ලද ද යන්න නිගමනය කළ නො හැකි ය. කෙසේ හෝ නිකාය කීපයක භික්ෂූන් එක, විහාරයක වාසය කරවීම නිකාය භේදය අඩුකිරීම සඳහා රජවරුන් සහ සංඝනායක-වරුන් විසින් හිතාමතාම යොදනු ලැබූ උපායක් විය හැකියි. ජෙතවනයෙහි වසන භික්ෂූන් නිකාය භෙදයක් නො සලකා නිශ්‍රය ලැබූ අය විය යුතු යයි ජෙතවනාරාම සංස්කෘත සෙල්ලිපියෙහි සඳහන් වේ.[59] නිකාය භේදය අඩු කිරීමට ගත් මෙවැනි පියවර හේතු කොටගෙන පසු කාලවල සාර්ථක ප්‍රතිඵල ලැබුණු බවට හේතු සාධක තිබේ.

ක්‍රි.ව. 9 වෙනි සියවසේ සිට ආගමික සහ දේශපාලන හේතූන් උඩ එක අරමුණක පිහිටා ක්‍රියා කිරීමේ හැකියාවක් නිකායත්‍රයවාසී භික්ෂූන්ට තිබූ බව පෙනේ. 1 සේන (ක්‍රි.ව. 853–887) රජු සමඟ උරණ වී මධ්‍ය කඳුකරයට පලා ගිය යුවරාජමහින්ද නැවත රජතුමන් හා සමගි කරලීම සඳහා ඔහු රජු වෙතට ගෙන යන ලද්දේ ත්‍රෛනිකායක-භික්ෂූන් විසිනි.[60] V කාශ්‍යප (ක්‍රි. ව914–923) රජතුමා රෝගභය සහ නියං භය දුරු කරලීම සඳහා නිකායත්‍රයවාසී භික්ෂූන් ලවා පිරිත් දේශනා කර වූ බව මහාංවසය කියයි.[61] IV සේන (ක්‍රි. ව. 954–956) රජතුමා ලොහප්‍රාසාදයෙහි රැස් වූ නිකායත්‍රයවාසී භික්ෂූන්ට සූත්‍රාන්ත විස්තර කළ බව මහාවංසයෙන් හෙළි වෙයි.[62] මේ අනුව මුල් කාලවල පැවති නිකාය භේදය ක්‍රි.ව. 10 වෙනි සියවස වන විට අනුක්‍රමයෙන් අඩු වී ගිය බවක් පෙනේ.

ක්‍රි.ව. 10 වෙනි සියවසේ අග භාගයේ සිට එල්ල වූ සොළී ආක්‍රමණ හේතුකොට ගෙන නොසන්සුන් තත්ත්වයක් ඇති වූ හෙයින් භික්ෂූන්ගේ සාමාකාමී ජීවිතයට එයින් බාධාවන්ට ඇත. එතැන් සිට නිකාය අතර වූ එකමුතුකම කොතරම් දුරට රැකුණේද යන්න පැහැදිලි නොවේ. 1 විජයබාහු (ක්‍රි.ව. 1055–1110) රජතුමා මනහර විහාරයක් කරවා තුන් නිකායවාසී භික්ෂූන් එහි වාසය කරවූ බව මහාවංසය කියයි.[63] තුන් නිකාය නමින් මෙහි සඳහන් වන්නේ මහාවිහාර, අභයගිරි, ජේතවන යන නිකාය විය යුතුයි. මෙම නිකායත්‍රය සඳහා එක විහාරයක් කරවා පූජා කරන්ට ඇත්තේ ඒවා අතර එකමුතුකමක් තිබූ නිසා විය යුතුයි; නැතහොත් අවශ්‍ය එකමුතුකම් එමගින් ඇතිකරලීම සඳහා විය යුතුයි. මේ කාලයේදී නිකාය අතර සමීප සම්බන්ධතාවක් තිබුණත් නැතත් රට ආපදවන්ට මුහුණ පෑ අවස්ථාවල නිකාය තුන එකමුතුව අපදුවලින් රට මුදවා ගැනීමට ඉදිරිපත් වූ බව පෙනේ.[64] 11 ගජබාහු (ක්‍රි.ව. 1132–1153) සහ 1 පරාක්‍රමබාහු (ක්‍රි.ව. 1153–1186 ) රජතුමා අතර පැවැති නිරන්තර සටන් නතර කොට එම රජුන් අතර සමගි සන්ධානයක් ඇති කිරීම සඳහා තුන්නිකායවාසී භික්ෂූන් ඉදිරිපත් වූ බව සංගමු විහාර සෙල්ලිපියෙන් මෙන්ම මහාවංසයෙන් පෙනේ.[65] එහෙත් මහාපරාක්‍රමබාහු රජතුමා නිකාය සමගිය කළ අවස්ථාව වනවිට නිකාය අතර එකමුතුකමක් නොතිබූ බවත් ඔවුනොවුන් සමගි කිරීම ඉතාම බැරෑරුම් කාර්‍ය්‍යයක් වූ බවත් වංශකථා කියයි.[66] වංශකථා මෙහි දී තරමක් අතිශයෝක්තියට බර වී ඇතැයි සිතිය හැකිය. යටත් පිරිසෙයින් ආපද අවස්ථාවලදීවත් නිකාය අතර එක්සත්කමක් පැවැති බව පෙනෙන හෙයිනි.[67] කෙසේ වුවත් මහාපරාක්‍රම බාහු රජතුමා විසින් නිකාය සමගිය ඇති කිරීමට ප්‍රථම මහාවිහාර නිකාය සෙසු නිකායන් අභිබවා ඉස්මතු වී සිටි බව නිකාය සමගියේ දී ප්‍රධාන තැන් ගත් භික්ෂූන් දෙස බලනවිටත් නිකාය සමගියේ තීරණ දෙස බලනවිටත් පෙනී යයි.[68] මහා විහාරය හා සසඳනවිට සෙසු නිකායවල බලය නිකාය සමගිය කරන විට පිරිහී තිබීම ද මහාවිහාර බලය වර්ධනය වීමට හේතුවක් විය.

වළගම්බා රාජ්‍ය කාලයේ සිට දඹදිවින් වරින්වර පැමිණි මහායාන නිකායවල ආධාර ලැබීම නිසා විශේෂයෙන් අභයගිරිකයන්ගේත් සාමාන්‍යයෙන් ජේතවනිකයන්ගේත් බලතල වැඩි වූ බව පෙනේ.[69] එහෙත් 11 සේන රජුගේ (ක්‍රි.ව. 853–87) කාලයේ සිට මෙම තත්ත්වයෙහි වෙනසක් වන්ට ඇත. එම රජතුමා තුන් නිකාය දහම් ගැන්වීමෙන් ශාසන ශෝධනයක් කළ බව නිකාය සංග්‍රහයෙහි සහ මහාවංසයෙහි සඳහන් වේ. නිකාය සංග්‍රහයෙහි ඒ පිළිබඳව සඳහන් වන්නේ මෙසේ යි. ''තුන් නකය දහම් ගන්වා ලෝ සසුන් සෙමෙහි තබා, සද්ධර්ම ප්‍රතිරූප ලක්දිව නොවැද්ද දෙන සේ කරය වටා රකවල් යොදවා දැහැමින් රජය කළේය.''[70] මෙහි සද්ධර්ම ප්‍රතිරූප නමින් සඳහන් වන්නේ වාජිරිය නොහොත් වජ්‍රපර්‍වත නිකායිකයන් විසින් පතුරුවන ලද ධර්මය විය යුතුයි. 1 සේන රජුගේ කාලයේ පැමිණි වජ්‍රපර්‍වත නිකායවාසී වූ භික්ෂු ප්‍රතිරූපකයෝ එම රජතුමාට මෙම ධර්මය පිළිගැන්වූහ.[71] 11 සේන රජතුමා තුන් නිකාය දහම් ගන්වා, සද්ධර්ම ප්‍රතිරූප නැවත ලක්දිව පැතිරවීමට ඉඩක් නැතිවන අන්දමට හාත්පසින් ආරක්ෂා සංවිධාන යෙදූවේ ය.

ඉන්පසු වජ්‍රයානිකයන් හෝ මහායානිකයන් ලංකාවට අවුත් ධර්මප්‍රචාරය කළ බවක් සඳහන් නොවන හෙයින් 11 සේන රජතුමා යෙදූ ආරක්ෂා සංවිධාන සාර්ථක වූ බවත් එකවරට පෙනී යයි. එම රජතුමා ගේ කාලයෙහි සහ ඉන්පසු ස්වල්ප කාලයක් ගතවනතුරුත් ඔහු යෙදූ පිළියම් සාර්ථක වන්ට ඇත. විජයබාහුගේ රාජ්‍ය කාලයෙහි පවා එම බලපෑම් අඩු වූයේ ඇතැම් විට සේන රජතුමා යෙදූ ආරක්ෂා සංවිධාන නිසා විය හැකියි. එසේ වුවත් එතෙක් ලංකාවට වජ්‍රයාන බලපෑම් ඇති වූ හැටියට සැලකිය හැකි බෙංගාලය, මගධය යන රටවල සහ ලංකාවේ දේශපාලන තත්ත්වය බලන විට මෙම බලපෑම් අඩුවීමට වෙනත් හේතූන් ද බලපා ඇති බව පෙනේ.

ගෝපාල, (ක්‍රි.ව. 750–770) ධර්මපාල (ක්‍රි.ව. 770–810) දේවපාල (ක්‍රි.ව. 810–850) යන පාල රජුන්ගේ කාලවල බෙංගාලයේ සහ මගධයේ වජ්‍රයාන බුද්ධාගම ඉතා දියුණුව පැවතිණ.[72] දේවපාල රජුගේ අභාවයේ සිට පාල රාජ්‍යයේ දේශපාලන නොසන්සුන්කම් ඇති විය.[73] ඉන්පසු එහි බෞද්ධ කටයුතුවල පිරිහීමක් ඇති වූ බව පෙනේ. නැවත බුද්ධාගමේ දියුණුවක් ඇති වන්නේ ක්‍රි.ව. 988 දී පමණ රජ වූ මහිපාල රජුගේ සහ නයපාල යන රජුගේ කාලවලය.[75] එතැන් සිට ලංකාව අභ්‍යන්තර කැරලිවලින් සහ සොළී උවදුරුවලින් ගහණව කලක් පැවති හෙයින් ධර්ම ප්‍රචාරය සඳහා පහසුකම් ඇති නොවන්නට ඇත. නැවත පාල රජුන් යටතේ වජ්‍රයාන බුද්ධාගමේ දියුණුවක් දක්නට ලැබෙන්නේ රාමපාල (ක්‍රි.ව. 1077–1120) රජුගේ කාලයේය.[75] එවකට ලංකාවේ රජ වූයේ 1 විජයබාහු රජතුමාය. මොහුගේ රාජ්‍ය කාලයේ බොහෝදුරට සාමය පැතුරුණු යුගයක් වන හෙයින් මෙකල විදේශීය බෞද්ධයන්ට ලංකාව සමගත්, ලංකාවේ බෞද්ධයන්ට විදේශ සමගත්, ආගමික සම්බන්ධතා පැවැත්වීමට සුදුසු වාතාවරණයක් ඇති විය.

විජයබාහු රජතුමා (ක්‍රි.ව. 1055–1110) අගනා රුවන් යවා දඹදිව මහාබෝධිය නොයෙක් වර පූජා කළ බව මහාවංසය කියයි.[76] එකලට අයත් පුරාවිද්‍යා සාධක අනුව වජ්‍රයානිකයන් හා ලංකාව අතර සම්බන්ධතා පැවැති බව පෙනේ. මහියංගණ දගැබෙන් ලැබුණු ගල්පුවරුවක එක් පැත්තක බුද්ධ රූපයක් ද අනික් පැත්තේ නාගර අක්ෂරවලින් ලියන ලද ''යෙ ධර්මා හෙතුප්‍රභවා'' යන පාඨය ද දක්නට ලැබේ. එය විජයබාහු රාජ්‍ය කාලයට අයත් බව පෙන්වන පරණවිතාන මහතා උතුරු ඉන්දියාවේ බෞද්ධයන් ලංකාව හා පැවැත් වූ ආගමික සම්බන්ධතා එයින් ප්‍රකට කෙරෙන බව ද කියයි.'' තවද මගධ බෞද්ධ මූර්ති සම්ප්‍රදායට අයත් හැටියට සැලකෙන කැටයමක අවලොකිතෙශ්වර සහ මෛත්‍රෙය බෝධිසත්වයන් නිරූපණය කර තිබේ. එය ක්‍රි.ව. එකොළොස්වන සිය වසට අයත් බව පෝගල් මහතා කයයි[78]. විජයබාහු රජුගේ කාලයේ උතුරු ඉන්දියාව හා ලංකාව අතර පැවැති සම්බන්ධතා ගැන බලන විට එම කැටයම් රූපය ලංකාවට ගෙනෙන්ට ඇත්තේ 1 විජයබාහු රජුගේ කාලයේ බව අනුමාන කළ හැකි වෙයි. යට දැක් වූ කැටයම් රූප දෙකින්ම හෙළිවන්නේ වජ්‍රයාන ලක්ෂණ හෙයින් විජයබාහු රජුගේ කාලයේ ලංකාවට වජ්‍රයාන බලපෑම් ඇති වූ බව සිතීමට ඉඩ ඇත. රාමපාල (ක්‍රි.ව. 1077–1120) රජුගෙන් පසු පාල රාජ්‍යයේ ඇති වූ පිරිහීමත් සමග වජ්‍රයාන බුද්ධාගම ද පිරිහෙන්ට ඇත. මින්පසු බෙංගාලයෙන් සහ මගධයෙන් වජ්‍රයාන බලපෑම් ලංකාවට ඇති නොවූ බව පෙනේ. මේ හේතුකොට ගෙන ලංකාවේ වජ්‍රයානිකයන්ගේ දියුණුවත් ඔවුන්ගෙන් පෝෂණය ලැබූ අන් නිකායවල දියුණුවත් තරමක් දුරට අඩාල වන්ට ඇත.

අඹහෙරණ සලමෙවන් රාජ්‍ය කාලයේදී දඹදිවින් පැමිණි ජෝතිපාල නම් ආචාර්‍යවරයෙකු විසින් වෛතුල්‍යවාදීන් මර්දනය කරන ලද බව නිකායසංග්‍රහයෙහි සඳහන් වේ.[79], අඹහෙරණ සලමෙවන් රජු මිය ගිය පසු ජේතවනික භික්ෂූන් මහාවිහාරවාසීන්ට අවනතව විසූ බව ද එහි කියැවේ.[80] මෙය පිළිගතහොත් මහාවිහාරිකයන්ගේ බලය වර්ධනය වීමට එක හේතුවක් එයින් හෙළි වෙයි. මෙම රජතුමාගේ කාලයේ වෛතුල්‍ය ධර්මයේ ප්‍රචාරය සඳහා අභයගිරිවාසීන් ජේතවනිකයන් හා එකමුතුව ක්‍රියා කළ බව පෙනේ. ජේතවනිකයන් ඉන්පසු මහාවිහාරයට අවනතව විසූයේ නම් එයින් මහාවිහාරයේ බලය වැඩිවීමත් සමගම අභයගිරිකයන්ගේ බලය හීනවන්ට ඇත. අනුරාධපුර කාලයේ අවසානය දක්වා මේ තත්ත්වය පවතින්ට ඇති බව අනුමාන කළ හැකිය. සොළී පාලනය පැවැති සමයෙහි දී වුවත් එහි වැඩි වෙනසක් වූ බවක් නොපෙනේ.

අභයගිරි, ජේතවන දෙනිකාය මුලදී දියුණුවට පත්වීමට බැහැරින් ලැබුණු උදව් හේතුවන්ට ඇත. සොළී පාලනය පැවැති කාලය තුළ එලෙස උදව් ලැබීමක් නො වූ නිසා ඒවායේ බලය හීනවූ බවක් මිස වැඩිවීමක් වූ බවක් නොපෙනේ. අනික් අතට මහාවිහාරය දේශීය පරිසරය තුළින් වැඩුණු සම්ප්‍රදායක් ඇතිව දියුණු වූ නිකායකි. හීනයානය ජාතික සම්ප්‍රදායක් ඇති එකක් හැටියට වාල්ස් එලියට් මහතා හඳුන්වයි.[81] අභයගිරි, ජේතවන දෙනිකාය දේශීය සම්ප්‍රදාය තුළින් බිහි වූවත් විදේශ බලපෑම්වලින් බෙහෙවින් ප්‍රභාවිත වීම නිසා ඒවායේ තිබූ දේශීය ලක්ෂණ යටපත් වන්ට ඇත. එහෙයින් බැහැරින් ආධාරයක් නොලබා පවත්වාගෙන යෑමට නොහැකි තත්ත්වයක් වජ්‍රයානයට මෙන්ම අනික් නිකාය දෙකටත් ඇතිවී යයි අනුමාන කිරීමට පුළුවන. දේශපාලන නොසන්සුන්කම් හේතු කොට ගෙන පොදුවේ සෑම නිකායකටම දුෂ්කරතාවලට මුහුණ පාන්ට සිදුවන්ට ඇත. එහෙත් ඉහතින් දක්වූ හේතු අනුව සෙසු නිකායන් හා සසඳන විට මහාවිහාරික බලය, නිකාය සමගිය කළ අවස්ථාවේදී වැඩිදියුණු වී පවතින්ට ඇත.

සොළී පාලනයෙන් පසු රජ වූ විජයබාහු රජතුමා (ක්‍රි.ව. 1055—1110) ශාසනයේ දියුණුවට කටයුතු අරඹන්නට සූදනම් වන විට සිල්වත් භික්ෂූන් පස්නමක්වත් සොයා ගැනීමට නොහැකි තරමට ශාසනික තත්ත්වය පිරිහී ගිය බව පෙනේ.

1 විජයබාහු රජතුමා සහ රාමඤ්ඤ රටේ අනුරුද්ධ (අනෝරථ) රජතුමා නියම, බුද්ධධර්මය ගැබ් වූ පිටක ග්‍රන්ථ සම්බන්ධයෙන් සම්මුතියකට පැමිණි බව මේබල් බෝඩ් මහත්මිය කියයි.[82] අනුරුද්ධ රජතුමා ලංකාවෙන් පිටක පොත් ගෙන්වා ගෙන ඒවා සුධම්මපුරයෙන් ලබාගත් පිටක ග්‍රන්ථ හා සසඳා බලා කිසිම අඩුවැඩිකමක් නැතිව එකිනෙක සැසඳෙන බව දැන ''පිටක ගර්භයෙහි'' තබා පූජා කළ බව සාසනවංසයේ සඳහන් වේ.[83] පිරිසිදු පිටක ග්‍රන්ථ මොනවා දැයි තෝරා ගැනීම සඳහා රාමඤ්ඤ රජු හා සම්මුතියකට එළඹීම පිළිබඳ සිද්ධිය ලංකාවේ ඉතිහාස පුරාවෘත්තවල සඳහන් නොවේ. අරමණයෙන් පොත්පත් ගෙන්වූ බව පමණක් නිකාය සංග්‍රහයෙන් හෙළිවේ. ''ආගම ය ද ගෙන්වා'' යනුවෙන් පූජාවලියෙහි කියන්නේත් එය ම බව පෙනේ.[84], විජයබාහු රජතුමා අටුවා සහිත පිටකත්‍රය සජ්ඣායනා කරවූ බවක් මහාවංසය කියයි.[85] මේබල් බෝඩ් මහත්මිය කියන හැටියට විජයබාහු සහ අනුරුද්ධ රජතුමා පිරිසිදු ධර්ම ග්‍රන්ථ පිළිබඳව සම්මුතියකට පැමිණියේ නම් යට දක් වූ පරිදි අටුවා සහිත ත්‍රිපිටකය සජ්ඣායනා කරන්ට ඇත්තේත් ලංකාවට පොත්පත් ගෙන්වන්ට ඇත්තේත් ඒවා ලංකාවේ පිටක ග්‍රන්ථ හා සසඳා බැලීම සඳහා යයි අනුමාන කිරීමට පුළුවන. එසේ නම් මහාවිහාර සම්ප්‍රදයේ දියුණුවට එයින් මහත් අනුබලයක් ලැබෙන්ට ඇත. බුරුම සම්ප්‍රදාය හා මහාවිහාර සම්ප්‍රදාය අතර කිට්ටු සම්බන්ධයක් පැවති හෙයින් ලංකාවේ සහ බුරුම රටේ රජුන් සම්මුතියකට එළඹ පිරිසිදු බුද්ධධර්මය කුමක් දැයි තීරණය කළේ නම් එයින් සත්‍ය ධර්මය හැටියට පිළිගැනෙන්නට ඇත්තේ මහාවිහාර සම්ප්‍රදාය මගින් රැකගෙන ආ පිටක ග්‍රන්ථ විය හැකිය.

එසේම විජයබාහු රජතුමා බුරුම රටින් සිල්වත් භික්ෂූන් විසිනමක් හෝ විසිපස් නමක් ගෙන්වා පැවිදි උපසම්පද පිහිටුවා එයින් ශාසනය නගා සිටු විය.[86] මේ ගැන සඳහන් වන පොළොන්නරුවේ වේළයික්කාර පුවරු ලිපියෙහි 1 වන විජයබාහු රජ අරමණයෙන් භික්ෂූන් ගෙන්වා ශාසන ශෝධනයක් කළ බව සඳහන් වේ.[87] ඔහු බොහෝ විහාර කරවා තුන් නිකායවාසී භික්ෂූන්ට පූජා කළේය.[88] නිකාය තුනටම වෙනසක් නැතිව පුද සැලකිලි දක්වූ බවට එයින් ඉඟියක් ලැබේ. බුරුම රටින් සිල්වතුන් ගෙන්වා පැවිදි උපසම්පද කිරීමෙන් සිදු කළ ශාසනික සේවය නිකාය තුනටම බෙදී යන්ට ඇතැයි එයින් අනුමාන කළ හැකියි. මෙම උපසම්පදව පොදුවේ සෑම නිකායක්ම